

**මෘදු හඬින් ගැයෙන
ශෝකිම ගීයක
පද පේළි අතර සරන්නෙමි .
ඔබ ඒ අතර වේදැයි
සිතෙහි පිටු පෙරළ පෙරළා
බලන්නෙමි.**

**රැයද නික්මෙයි
ඔබ හමුවූ වග
කිසිවෙකුට නොකියා රකින්නෙමි.**

**රසිකා ගුණවර්ධන**

## ඊයේ සහ අද

### ප්‍රේමවංශ දසනායක

ඊයේ දින හැන්දෑවේ
හිරු අවරට යන යාමේ
මේ මං පෙත මෙතැනට වී
මා සිටියා ඔබ පතමින්

ඊයේ දින හැන්දෑවේ
හිරු අවරට යන යාමේ
මේ මං පෙත මෙතැනට විත්
ඔබ සිටියා මා පසෙකින්

ඊයේ දින හැන්දෑවේ
හිරු නිවෙනා සෙවනැල්ලේ
හද පිරවුන සැහැල්ලුවෙන්
අප සිටියා ලොව දිනමින්

ඊයේ දින දැන් ගෙවී ගොසින් ඇත
ඊයේ පිපි මල් පරව ගොසින් ඇත

ඉර හඳ දෙක දෑතට ගෙන
කරකවලා එක හුස්මට

ඊයේ දින මම අදත් ගෙනෙන්නම්
ඊයේ මෙන් ඔබ අදත් කියයි නම්

සදාකල් හදවතින්
මම ඔබට ආදරෙයි

## මහලු විය

### ආනන්ද දිසානායක

ශ්‍රී ලංකාව

ඉරුණු කබායට පිලියම් කෙරී ඇත
අපගේ මහලු විය කාටත් දැනී ඇත
දූ දරුවන්ගේ සෙනෙහස නොඅඩුව ඇත
තව ටික කලක් ඉදිනට පෙර පිනක් ඇත

ආපසු හැරී බැලූවිට මේ ජීවන කතරේ
සැනසිය හැකිය දිය පොද ලෙස වැලි කතරේ
දරුවන් සැදිම් යහගුණ සිප්හල අතරේ
ඒ පින මදිද යලි උපදින්නට සසරේ

දරු මුණුපුරන්ගේ දස්කම් පෙල ගස්වා එකට
දැනුනේ සතුටමයි සැනසීමක් අපට
යහගුණ පිරි ලොවක් හෙට ඉපේදී අවට
දරුවන් සැමට ජය සැප සතුට දැනේවි හෙටට

යලි උපදින්න මේ සිරිලක බොදු සෙවනේ
අප කල පින් මහිම මදි නැතුවා සෝදිනේ
අපේ මව් බිමට ආසිරි පතමින් සොදිනේ
මහලු වියත් පසුකර යන්නම් ඉතිනේ

## මංගල යෝජනාව

### ප්‍රනීත් කාරියවසම්

මලක් සදිසිය ඈ
බෝ පුන්‍යවන්තී
ඇසක් මෙන් සුරැකී
සුචරිත්වත් දියු

ගම්බිම් මසුරන් ද
අබරණ දෝත පිරි
ඇරයුමයි මේ ඔබට
ධනැති පිනැති කුලවත් පුතුනි

පිරිමි ඇසකින්වත් නොඉඳුල්ය
මැදුරු දොරටම කොටු වී
හැදුණාය
සඳ එළිය දුටුවේත්
යන්තමට කවුළුවකින්ය
සාර සුබාවට පිළී
මලක් සේම හිනැහේය

සතර සිව් වේදයම පිරිසිඳ
නගර දොරකඩින් පිදුම් ලත්තී
තිස් පස් වියැතිය
ලාබාල පෙනුමැත්තීය

මසුරන් පොදිය අතින් ගෙන
දෑස් දල්වා හිදින්නී
ආදරය තැපැල් කර එවනු මැන
සරණ සොයා බලා ඉන්නී

## මගේ සිහිනය....ඔබට.

### ඉන්දික ගුණවර්ධන

මගෙ දුවේ නුඹ
තව බොහෝ දුර යා යුතුයි
නිම නොවූ මේ
ගමන් අවසන් කළ යුතුයි
තව බොහෝ දුර යා යුතුයි

කටු කොහොල් ළග
සුවද මල් මිය ඇදුන
මඩ ගොහොරු මිස
පයට පාවඩ නොදෙන
පාර විතරක් කියා යන්නම්
එයයි මගේ ආදරය
යන්න නොබියව
එමග කරමින් එළිය

සඳ තිබුණු තැන
ඝණ අදුර රජ කරන
හිස් අහස මිස
තරු නොමැත මග කියන
මගේ සිහිනය තබා යන්නම්
එයයි මගෙ දායාදය
සොයායන්නට
ඔබට ඔබෙ ජීවිතය



## පිළිගම් සෙනෙහෙන් පෙරසේ

### ආශා ඩී පෙරේරා

**හිතුවක්කාර රෑ සදපාන
ගිලූණා ඝනදුරු අහසේ
සදටම ලීව පෙම්කවි ගාව
වැළපෙයි මතකය රහසේ
තනි උනුදාට තරුමල් යාය
හිනැහෙයි ඔය ඇස් විලසේ
ගිය දුර ඇත වැඩි බව බෝම
වැටහෙයි මතුයම් දවසේ**

**හිතුවක්කාර සුළගක් ගාව
නොනිවී දැල්වුනු පහනේ
එලියෙන් පාර මග නොඅසාම
කෙළෙසද තිර සිද දැමුවේ
දේදුණු පාට සමනල් හීනමයි
නුඹ සැමදා පැතුවේ
සමනල් යාය තහනම් වේවි
ගිලිහුණදා මිණි කිරුළේ**

**ගගුළක් සේම හිතුවක්කාර
කැළතී කැළතී ගැලූවේ
උල්පත ගාව සෙනෙහස තාම
නැතිවද හදටම දැනුණේ
දුර ඇදුනාම මග නොසොයාම
අවතැන් වෙයි දිවි සයුරේ
යළි එනදාක ගතු නොකියාම
පිළිගම් සෙනෙහෙන් පෙරසේ**

## තාත්තාගේ කදුළු කවිය

### ප්‍රභාත් එම්. අහංගමගේ

මපුත
මෙහි නම් දුක් බොහෝම ය
දුබික් නිමවන
ලකුණු නැතිමය.....

වැහි දියවරක සුහුඹුල් සුවද
බොරු පිණි පොදක තවරන
ඉදුදුන්නක නැමියාවක් දුටු නෙත
වස්සානය ඒම යයි
කෙලෙස සිතනුද....?

පැසුළුදිගින් මේ උතුරුකුරු දිවයිනට
හමා ආ වියරු සුළි සුළග
පරපුරක කදුළු බිදු පුරෝගෙන
ඉතුරන්න අඩන්නට හිටිය
මේකුළුත් පා කළා සත්තයි.....

එද... යම් මතු දිනෙක
මේ බිමට වැසි වැටිය යුතුමය
පුරන් වී හති අරින
මේ මවු දෙරණ පුරාවට
නිතින් තුඩු දෙන
ගොවි පුතුන්ගේ නැවුම් අඩහැරයට
නුඹේ හඩවරද
එක්කාසු වනු නිසැකය.....

ඉදින්... මා පුත
උත්තරා - දක්ෂිණා තරු පොකුරු
එකම ගගනතක
දොඩමළුව ඉන්නා යම් මතු රැයක
නුඹලාට එකමුතුව ගයන්නට
ලියැවෙනා ගීතයක පද වැලට
මගේ මේ කදුළු බිදු
එකින් එක අහුලා තබමි.